කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 03 WW/O/22/11/10/03
වර්ණය : ඇම්බර්

## තද සුළං සහ මුහුදු රළුවීම පිළිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2022 නොවැම්බර් මස 11 දින ප.ව.4.30 තෙක් වලංගු වන පරිදි
2022 නොවැම්බර් මස 10 දින ප.ව. 4.30 ට නිකුත් කරන ලදී.

### මඩකළපුව සිට ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

### සැලකිලිමත් වන්න!

**නිරිත දිග බෙංගාල බොක්ක (BOB) සහ ඊට යාබද සමකාසන්න ඉන්දියන් සාගරය ආශ්‍රිතව (ශ්‍රී ලංකාවට ගිනිකොන දෙසින් ) පවතින අඩු පීඩන කලාපය වර්ධනය වී, වයඹ දෙසට බරව ගමන් කරමින් ශ්‍රී ලංකාවේ උතුරු වෙරළ දෙසට ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

උතුරු අක්ෂාංශ 07 ත් 17 ත් සහ නැගෙනහිර දේශාංශ 79 සහ 87 ත් අතර මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (50-55) පමණ වන අතර විටින් විට පැ.කි.මී. 60 දක්වා වැඩිවිය හැක.

ඉහත කී මුහුදු ප්‍රදේශ ඉතා රළු හෝ රළු වන අතර තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක.

**ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා වන වෙරළ ආසන්න මුහුදු ප්‍රදේශ වල මුහුදු රළ මීටර්. (2.5-3.0) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.**




**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **මඩකළපුව සිට ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා (උතුරු අක්ෂාංශ 07 ත් 17 ත් සහ නැගෙනහිර දේශාංශ 79 සහ 87 ත් අතර) වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ වල තවදුරටත් යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**

- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **03** WW/O/22/11/10/02

COLOR: **Amber**

# Advisory for strong winds and rough seas.

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 4.30 p.m. 10 November 2022, valid until 4.30 p.m. 11 November2022

## For deep and shallow sea areas from Batticaloa to Mannar via Trincomalee and Kankasanthurai.

**PLEASE BE AWARE!**
**The low-pressure area in the South-east of Sri Lanka has intensified further and it will move towards the Island.**

Wind speeds will be (50-55) kmph and can increase up to 60 kmph in sea areas between (07N - 17 N) and between (79E – 87E).
Heavy showers or thundershowers and very rough or rough seas can also be expected in above sea areas.

**There is a possibility that near shore sea areas off the coast extending from Trincomalee to Mannar via Kankasanturai may experience surges due to the effect of swell waves, having (2.5-3.0) m height.**

Advisory for Fishing and Naval Communities
issued at 04.30 p.m. on 10 November 2022, valid for next 24 hours




**Actions Required:**

- **Naval and fishing communities are advised not to venture into the sea areas off the coast extending from Batticaloa to Mannar via Trincomalee and Kankasanturai (07N-17N, 79E-87E) further.**
- **Those who are out at aforementioned sea regions are advised to return to coasts or moved safer areas immediately.**
- **Fishing and naval community are requested to be attentive to future forecasts issued by the Department of Meteorology in this regard.**